2019 . 07 . 12 2019 A/L

# ද මැසනඩ් විද්‍යාලය

2019 උසස් පෙළ විභාගයට පෙනී සිටින සිසුන් වෙනුවෙන් පැවැත්වෙන කඩයිම් වාර පරීක්ෂණය

2019 අගෝස්තු

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය.

I පිළිතුරු

කාලය පැ. 02

Learning Resource Center
R
De Mazenod College
Kandana

■ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

I - කොටස

01. මාධ්‍ය සංස්කෘතිය පිළිබඳ ව ගුවන් විදුලි සාකච්ඡාවක් තුළ දී ඉදිරිපත් වූ මතවාද කිහිපයක් පහත දැක්වේ.

A. බටහිර සංස්කෘතිය මූලාශ්‍රය කරගත් බව
B. මාධ්‍ය තාක්ෂණය සමඟ ප්‍රතිබද්ධ වී ඇති බව
C. සමාජ ගතිකවලට අනුව හැඩගැසීම
D. ස්වභාවික ක්‍රියාවලියට වඩා සැලසුම් කරන ලද ක්‍රියාවලියක් වීම

ඉහත අදහස් වලින් සත්‍ය වන්නේ,

1) A හා B පමණි
2) A හා C පමණි
3) A, B හා C පමණි
4) B, C හා D පමණි
5) A, B,C හා D යන සියල්ලම ය.

02. සමාජයක පවතින ව්‍යවසාය මූල සංවිධානයක් ලෙස සැලකිය හැක්කේ,

1) වෘත්තීය සමිතිය.
2) මරණාධාර සමිතිය
3) ප්‍රාදේශීය සභාවය
4) ග්‍රාමීය ණය දෙන සමිතිය
5) කාන්තා සුභ සාධන සමිති ය.

03. කණ්ඩායමක් තුළ විසම්මුතියට ඉඩ නොලැබෙන්නේ,

1) නිදහස් මතධාරී පුද්ගලයන් සිටීමෙනි
2) පාලනය කරන ලද පුද්ගලයන් සිටීමෙනි.
3) විවිධ මත දරණ පුද්ගලයන් සිටීමෙනි
4) ප්‍රජාතන්ත්‍රවාදී මත දැරීමෙනි
5) සාධනීය ලෙස අදහස් සාකච්ඡා කිරීමෙනි.

04. මිනිසුන් අතර අදහස් සහ හැඟීම් සන්නිවේදනය කළ හැක්කේ, ඒවා

1) සංස්කෘතික ලක්ෂණ මගින් නියෝජනය වන්නේ නම් පමණි.
2) සංකේත මගින් නියෝජනය වන්නේ නම් පමණි,
3) ආචාර විද්‍යාත්මක ලක්ෂණ මගින් නියෝජනය වන්නේ නම් පමණි
4) සහවේදනය මගින් නියෝජනය වන්නේ නම් පමණි
5) නිරන්තරව භාවිත කරන්නේ නම් පමණි.

05. විදුලිය බිඳවැටීම පිළිබඳ මහජන පැමිණිලි ලබා ගැනීමට විවිධ ක්‍රම වේද සකස් කර තිබුණි. ඒවා අතුරෙන් අවම වැදගත්කමක් දරණු ලබන්නේ,

1) තැපැල් මගින් ගෙන්වා ගැනීම ය.
2) විද්‍යුත් තැපැල මගින් ගෙන්වා ගැනීම ය.
3) හදිසි දුරකථන අංකයකට ඇමතුම් ලබා දීම ය.
4) ගාස්තු රහිත හදිසි දුරකථන අංකයකට දන්වීම ය
5) කෙටි පණිවිඩයක් (SMS) ලබා ගැනීමය

06. පහත සඳහන් ප්‍රකාශ සැලකිල්ලට ගන්න.

A - සන්දේශයක මතුපිට අර්ථයට වඩා වැඩි දෙයක් අවබෝධ කර ගැනීම
B - පුද්ගල අනුභූතීන් සමඟ සම්බන්ධ වීම
C - මාධ්‍ය සාක්ෂරතාව වර්ධනය කර ගැනීම
D - විනෝදාස්වාදය මතුකර ගැනීම

ඉහත ප්‍රකාශ අතුරෙන් ජනමාධ්‍යවල නිර්මාණශීලී කියවීම යන්නට අදාළ ව වඩාත් ගැළපෙන්නේ,

1) A හා B පමණි
2) B හා C පමණි
3) A, B හා C පමණි
4) A, C හා D පමණි
4) B, C හා D පමණි

7. සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1) දෙපියවර ආකෘතියේ දී ජනමත නායකයන් සහ අනුගාමිකයින් සම්බන්ධ වේ.
2) සමූහ සන්නිවේදනය ග්‍රාහක සංඛ්‍යාව මත පමණක් ම තීරණය වේ.
3) ප්‍රවෘත්තියක් ග්‍රාහකගත වීම දොරටුපාල කාර්යය මත රඳා පවතියි.
4) රූපණය පුද්ගලබද්ධ සංසිද්ධියක් ලෙස දක්විය හැකි ය.
5) නව සමාජ අවශ්‍යතා මාධ්‍ය සංස්කෘතිය මගින් නිරූපණය කරයි.

8. ජනමාධ්‍ය මගින් ඉදිරිපත් කරනු ලබන සංදේශ ජනමත ප්‍රධානීන්ගේ මැදිහත්වීමකට ලක්වන බව පැහැදිලි කරනුයේ

1) දොරටුපාල සංකල්පයෙනි.
2) දෙපියවර සංකල්පයෙනි
3) සමාජ වගකීම් න්‍යායෙනි
4) ගැල්වුන්ගේ ගැටුම් න්‍යායෙනි
5) මාස්ලෝගේ අවශ්‍යතා න්‍යායෙනි

9. එක්තරා පුවත්පතක සංස්කාරක ප්‍රතිපත්ති මෙසේ ලැයිස්තු ගත කර තිබේ.

A - මළ සිරුරුවල ඡායාරූප පළ නොකිරීම.
B - මත්පැන් දැන්වීම් ඇතුළත් නොකිරීම.
C - ඇඩ්වටෝරියල් සඳහා ඉඩ ලබා නොදීම.
D - සූදු පිළිබඳ ප්‍රවෘත්ති ප්‍රතික්ෂේප කිරීම.

ඉහත ප්‍රතිපත්ති හැඳින්වීමට වඩාත් යෝග්‍ය යෙදුම කුමක් ද?

1) වාරණය 2) ස්වයං - නියාමනය

3) නීතිමය බාධක 4) පාරිභෝගික ආරක්ෂාව

5) ප්‍රකාශන නිදහස

10. සන්නිවේදන විවිධ ක්‍රමයන් ලෙස මුඛ පරම්පරාගතව එන ජන කථා වැදගත් වන්නේ ඒවා,

1) නිර්මාණාත්මක සන්නිවේදන භාවිතයන් නිසා ය.

2) සන්නිවේදන මූලාශ්‍රයක් නිසා ය.

3) පුද්ගලාන්තර සන්නිවේදන භාවිතයක් නිසාය.

4) කථන සන්නිවේදන භාවිතයක් නිසා ය.

5) ස්වදේශිකත්ව සන්නිවේදන රටාවක් නිසා ය.

Learning Resource Center
R
De Mazenod College
Kandana

11. පාසලේ විෂය සමගාමී කටයුතුවල දී පන්ති නායක, ශිෂ්‍ය නායක හා විවිධ සමිති සමාගම්වල සභාපති, ලේකම් වැනි තනතුරු දැරීමේ අවස්ථා ඔස්සේ ලැබෙන සමාජානුයෝජනය,

1) චරිතායනයකි 2) භූමිකා නිරූපණයකි

3) ස්වීකරණයකි 4) තදාත්මීකරණයකි

5) අනුකරණයකි

12. පහත දක්වෙන චර්යා අතුරෙන් අන්තර්වර්ති සන්නිවේදන නිපුණතාවක් නොවන්නේ කුමක් ද?

1) පරිකල්පනය 2) දවල් සිහින දැකීම

3) ආවර්ජනය 4) සිංහාවලෝකනය

5) සටහන් තබා ගැනීම

13. වර්ධනය වූ ගැටුමක් තිරසාර ලෙස විසඳා ගැනීමට වඩාත් සුදුසු ගැටුම් කළමනාකරණ ශෛලිය වන්නේ,

1) සහයෝගීව ක්‍රියා කිරීමයි 2) තරග වැදීම යි

3) මඟ හැරීමයි 4) ඉඩ හැරීමයි

5) සම්මුතික එකඟතාවයි

14. ජනමාධ්‍ය ග්‍රාහකත්වය තුළ දක්නට ලැබෙන ලක්ෂණයක් වන්නේ ග්‍රාහකයා,

1) සන්දේශයෙන් පමණක් බැඳී සිටීමයි.

2) එකම අරමුණක් වෙනුවෙන් එක් වූ පිරිසක් වීමයි.

3) මනා ලෙස සංවිධානගත වී සිටීමයි

4) සන්නිවේදකයා සමඟ සමීප සබඳතාවක් පැවතීමයි.

5) පැහැදිලිව ගණනය කළ හැකි වීමයි.

15. රූපවාහිනියෙන් විකාශය වන රාත්‍රී ප්‍රවෘත්ති නැරඹීමට සූදානම් වූ විශ්වට, රූපවාහිනියේ අපැහැදිලි රූප නිසා රටෙහි උද්ගතව පැවති ගංවතුර පිළිබඳ නිසි අවබෝධයක් ලබා ගත නොහැකි විය. මෙය සන්නිවේදන න්‍යායාත්මකව හඳුන්වන්නේ,

1) රූපවාහිනියෙහි කාර්මික දෝෂයක් ලෙසට ය.
2) අවට පරිසරයේ ගැටලුවක් ලෙසට ය.
3) මාධ්‍ය බාධාවක් ලෙසට ය.
4) ඇන්ටෙනාවෙහි දෝෂයක් ලෙසට ය.
5) පුද්ගල විභින්නතා න්‍යාය ලෙසට ය

16. ළමා චිත්‍රපටයක මූලික ලක්ෂණය විය යුත්තේ,
1) ළමා ලෝකය නිරූපණය කිරීම යි.
2) දක්ෂ ළමයින් වැඩි වශයෙන් යොදා ගැනීමයි
3) සරල කථා වස්තුවක් තිබීම යි.
4) ප්‍රවීණ නළු නිළියන් යොදා ගැනීම යි.
5) උපරිම විනෝදාස්වාදයක් ලබා දීම යි.

17. සාම්ප්‍රදායික මාධ්‍යවල ඇති වැදගත්කම පිළිබඳ පන්ති කාමරයේදී ඇති වූ සංවාදයක ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

නයනි - ඒවා ගැන පොදු ජනතාව තුළ විශ්වාසයක් තියෙනවා
ජයනි - එහි දී භාවිත වන සංඥා, සංකේත හුරු පුරුදුයි
විපුලි - ඒවායින් නිරූපණය වන්නේ ප්‍රභූන්ගේ අදහස් නොවේ.
රුවනි - ඒ වුනාට සක්‍රීය ග්‍රාහක සහභාගීත්වයක් නෑ

ඉහත ප්‍රකාශවලින් නිවැරදි අදහස් ඉදිරිපත් කරන්නේ,
1) නයනි හා රුවනි ය.
2) නයනි හා ජයනි ය.
3) නයනි, ජයනි හා රුවනි ය.
4) නයනි, ජයනි හා විපුලි ය.
5) නයනි, ජයනි, විපුලි හා රුවනි යන සියලු දෙනාම ය.

18. මාධ්‍යයක ප්‍රධාන ම හා මූලික ම අරමුණ වන්නේ,
1) සියලු සිදුවීම් ග්‍රාහකයන් වෙත වාර්තා කිරීම ය.
2) පාලක පන්තියේ දෘෂ්ටිවාදය ප්‍රචාරය කිරීම ය.
3) සමාජ අවශ්‍යතා විෂයමූලික තොරතුරු මගින් සංතෘප්ත කිරීම ය.
4) සමාජ විඥානය තුළ පුරවැසි සමාජ වටිනාකම් තහවුරු කිරීම ය.
5) කාලීන ප්‍රශ්න නිරාකරණය සඳහා ග්‍රාහකයින් සන්නද්ධ කිරීම ය.

2019.07.12 2019 A/L
13 ශ්‍රේණිය.

19. පළමුවරට හමුවන පුද්ගලයන් දෙදෙනෙකු අතර සාමාන්‍යයෙන් සිදු වන සන්නිවේදනයේ දී දක ගත හැකි අවස්ථා කිහිපයක් පහත දක්වේ.

A - පොදු - විස්තර කථා කිරීම
B - විවෘත හා ගැඹුරු විශ්වාසනීයත්වයකින් යුත් අදහස් හුවමාරුව.
C - එකිනෙකා සිනහ වීම හා හිස වැනීම
D - පෞද්ගලික තොරතුරු හුවමාරු කර ගැනීම

එම සන්නිවේදන ක්‍රියාවලියෙහි අවස්ථා ආරම්භයේ සිට අනුපිළිවෙළින්,

1) A, C, D හා B වේ
2) B, C, D හා A වේ
3) C, A, D හා B වේ
4) C, D, B හා A වේ
5) D, B, A හා C වේ

20. මාධ්‍ය විචාරයේ විවිධ ප්‍රවේශ තුළ දී සලකනු ලබන කරුණු කිහිපයක් පහත දක්වේ.

A - සිදුවීම නව මානයකින් බැලීම
B - ග්‍රාහක විඥානය පෝෂණය කිරීම
C - විශ්‍රාන්තික ලක්ෂණ විමර්ශනය කිරීම
D - අභිප්‍රේරණයක් ඇති කිරීම

මේවායින් ඓතිහාසික ප්‍රවේශය සමඟ වඩාත් ගැළපෙන්නේ,

1) A, B හා C පමණි
2) A, B හා D පමණි
3) A, C හා D පමණි
4) B, C හා D පමණි
5) A, B, C හා D සියල්ලම ය.

Learning Resource Center
R
De Mazenod College
Kandana

21. සන්නිවේදන උපකරණයක් ලෙස ගැමි මාධ්‍ය යොදා ගැනීමේ ප්‍රවණතාවක් නොවන්නේ,

1) නම්‍යශීලීභාවයයි
2) අවම පිරිවැයයි
3) ජන විඥානයට සමීප වීමයි
4) පුළුල් ව්‍යාප්තියයි
5) ප්‍රතිපෝෂණ හැකියාවයි

22. ගැටලුවකදී මැදිහත්කරුගේ භූමිකාවක් වන්නේ,

1) වෙන් වෙන්ව සාකච්ඡා කිරීමයි
2) පක්ෂපාතීව කටයුතු කිරීම යි
3) දුක්ගැනවිලිවලට සවන් නොදීමයි
4) ගැටුමට සෘජුව ම සම්බන්ධ වීම යි.
5) මත ගැටීමට අවස්ථාව ලබා නොදීමයි.

23. සංවර්ධන සන්නිවේදන ව්‍යාපෘති වාර්තාවක්, ඉදිරි ව්‍යාපෘති සඳහා වැදගත් වන්නේ,
1) එහි ඉලක්ක සහ අරමුණු පිළිබඳ විස්තර ඇතුළත් වන බැවිනි.
2) අනුග්‍රාහකත්වය සපයා ගත් ආකාරය සඳහන් වන බැවිනි.
3) මතු වූ ගැටලු සහ අත්දැකීම් ඇතුළත් වන බැවිනි
4) ව්‍යාපෘති කණ්ඩායම් පිළිබඳ විස්තර පවතින බැවිනි.
5) එය මුද්‍රිතව පොතක් ලෙස සකස් කර ඉදිරිපත් කරන බැවිනි.

24. දේශපාලන බලය පිළිබඳ උනන්දුවන බොහෝ පුද්ගලයන් ප්‍රධාන ආගමික ස්ථාන පිළිබඳ අනුග්‍රාහකශීලී වීම මූලික හේතුව ලෙස හඳුනා ගත හැකි වන්නේ,
1) ආගමික අනුශාසනා රාජ්‍ය පාලනය සඳහා අවශ්‍ය බව පිළිගැනීමයි
2) අදෘශ්‍යමාන බලවේගවල බලපෑම දේශපාලන බලය කෙරෙහි බලපාන බවට ඇති විශ්වාසයයි.
3) ආධ්‍යාත්මික නායකත්වය බල ව්‍යුහයේ එක් ප්‍රධාන අංගයක් වීමයි.
4) තම ආධ්‍යාත්මික නැඹුරුව ප්‍රදර්ශනය ජනතාව ආකර්ෂණය කර ගැනීමේ උපාය මාර්ගයක් ලෙස කල්පනා කිරීම.
5) පූජනීය සම්පත් හා ආගමික නායකත්වය බල කේන්ද්‍රීය සාධකයක් ලෙස ක්‍රියාත්මක වීමයි.

25. අලුත උපන් දරුවන්ට එන්නත් ලබාදීමේ දින පිළිබඳ ව සැලැස්මක් සෞඛ්‍ය නිලධාරියා විසින් සකස් කරන ලදී. දින අදාළ මව්වරුන් වෙත දැනුම් දීමට වඩාත් යෝග්‍ය සන්නිවේදන ක්‍රමය විය හැක්කේ කුමක්ද?
1) රූපවාහිනිය 2) පුවත්පත්
3) විද්‍යුත් තැපෑල 4) කෙටි පණිවුඩ (SMS)
5) මහජන ඇමතුම් පද්ධති

26. ඔබ මහජන සම්බන්ධතා නිලධාරියෙකු යැයි සිතන්න. ඔබගේ සේවය අවශ්‍ය වන අවස්ථා කිහිපයක් පහත දැක්වේ.
- රජය මගින් අලුතින් ආරම්භ කිරීමට යෝජිත නව ව්‍යාපෘතියක් පිළිබඳව මහජනතාවට විස්තරාත්මකව පැහැදිලි කිරීම
- වසර තුනකින් පසු පැවැත්වීමට නියමිත පළාත් සභා ඡන්දය සඳහා ඉදිරිපත් වීමට උනන්දුවෙන් පසුවන තරුණ සමාජ ක්‍රියාකාරිකයෙකු හඳුන්වා දීම
- විදුලි රැහැනක අලුත්වැඩියාවක් සඳහා විදුලි සැපයුම සති අන්තයේදී අත්හිටුවීම පිළිබඳ ජනතාව දැනුවත් කිරීම

ඉහත අවස්ථාවලට ගැළපෙන ක්‍රියාකාරකම්වල අනුපිළිවෙළ වන්නේ,
1) මාධ්‍ය නිවේදනය, මාධ්‍ය සාකච්ඡාව සහ ප්‍රතිරූපය ගොඩනැගීම ය.
2) මාධ්‍ය සාකච්ඡාව, මාධ්‍ය නිවේදනය, සහ ප්‍රතිරූපය ගොඩනැගීම ය.
3) මාධ්‍ය සාකච්ඡාව, ප්‍රතිරූපය ගොඩනැගීම සහ මාධ්‍ය නිවේදනය ය.
4) මාධ්‍ය නිවේදනය, ප්‍රතිරූපය ගොඩනැගීම සහ මාධ්‍ය සාකච්ඡාව ය.
5) ප්‍රතිරූපය ගොඩනැගීම, මාධ්‍ය සාකච්ඡාව සහ මාධ්‍ය නිවේදනය ය.

27. ප්‍රාථමික පන්ති කාමරයක ගණිත ගුරුතුමිය මූලික ගණිත සංකල්ප වටහා දීම සඳහා ගණිත රාමුව ඉගෙනුම් ආධාරකයක් ලෙස යොදා ගන්නේ සිසුන්ගේ,
   1) සංකල්ප සාධනය කර ගැනීමේ හැකියාව පුළුල් කර ගැනීමට ය.
   2) පරිකල්පන හැකියාව දියුණු කිරීමට ය.
   3) වියුක්ත සංකල්ප සංජානනය කර ගැනීමේ බාධා ඉවත් කිරීමට ය.
   4) ඉගෙනුම් ක්‍රියාවලියේ ප්‍රවර්ධකයක් ලෙස ය.
   5) සංකල්ප ධාරණය කර ගැනීමට පහසු කිරීමට ය.

28. නව මාධ්‍ය අපගේ ගෘහ ජීවිතය ආක්‍රමණය කර ඇති බව එක්තරා දේශකයෙක් අවධාරණය කර සිටියේ ය. එමගින් ඔහු අදහස් කරන්නේ,
   1) නව මාධ්‍ය භාවිතය, ප්‍රචණ්ඩත්වය වර්ධනය වීමට හේතු වී ඇති බවය.
   2) නව මාධ්‍ය භාවිතයේ පිරිවැය අවම වී ඇති බව ය.
   3) නව මාධ්‍ය සාක්ෂරතාව ඉහළ බැවින් මෙවැන්නක් සිදුවන බව ය.
   4) නව මාධ්‍ය තාක්ෂණයේ ප්‍රබලත්වය ශීඝ්‍රයෙන් ඉහළ යන බව ය.
   5) නව මාධ්‍ය භාවිතය ඉහළ යාම මගින් පුද්ගලයා හුදෙකලා වී ඇති බව යි.

29. මාධ්‍ය අරමුණු සහ කර්තව්‍ය නිර්මාණය කිරීමෙහි ලා මාධ්‍ය න්‍යාය සහ ව්‍යවහාරය තුළ ප්‍රකට ප්‍රවේශ දෙක වන්නේ,
   1) ප්‍රජාමූල සහ ව්‍යවසායමූල ප්‍රවේශයයි.
   2) විඥාපන සහ බලපෑම් ප්‍රවේශයයි
   3) සමාජීය සහ පුද්ගලික ප්‍රවේශයයි
   4) විනෝදාස්වාදී සහ ප්‍රවෘත්තිමය ප්‍රවේශයයි.
   5) වාණිජවාදී සහ මහජන සේවා ප්‍රවේශයයි.

30. සංවර්ධන සන්නිවේදනය යන සංකල්පය තහවුරු වූයේ,
   1) කාර්මික විප්ලවය ආරම්භ වූ පසුවය.
   2) පළමු ලෝක යුද්ධයට පසුව ය.
   3) දෙවන ලෝක යුද්ධයට පසුව ය.
   4) නිරවි යුද්ධය අවසන් වීමෙන් පසුව ය.
   5) ගෝලීයකරණ ක්‍රියාවලියේ ආරම්භයත් සමග ය.

31. යමක් දෙස තමන්ගේ දෘෂ්ටිකෝණයෙන් පමණක් නොබලා අනුන්ගේ දෘෂ්ටිකෝණයෙන් ඒ දෙස බැලීම සන්නිවේදනයේ දී හඳුන්වන්නේ,
   1) සංජානනය යනුවෙනි.　　2) ස්වසංකල්පය යනුවෙනි
   3) හෙජමොනිය යනුවෙනි　　4) සහානුභූතිය යනුවෙනි
   5) සංකථනය යනුවෙනි

32. ප්‍රාදේශීය ගැටලුවක් පිළිබඳ තොරතුරක් ප්‍රධාන ධාරාවේ ජනමාධ්‍ය මගින් ප්‍රචාරය නොවුව ද සමාජ මාධ්‍ය ජාලාවලින් සාකච්ඡාවට ලක්කර තිබුණි. මෙයට බොහෝ විට හේතු විය හැක්කේ,

1) නව ජනමාධ්‍යවේදය ය .
2) සංවර්ධන ජනමාධ්‍යවේදය ය
3) ගවේෂණාත්මක ජනමාධ්‍යවේදය ය
4) විද්‍යුත් ජනමාධ්‍යවේදය ය
5) පුරවැසි ජනමාධ්‍යවේදය ය

33. මාධ්‍ය සාක්ෂරතාව පිළිබඳ විවාදයකදී ඉස්මතු වූ කරුණුවලට අනුව එය

A - මාධ්‍ය අධ්‍යාපනයේ කොටසකි.
B - මාධ්‍යකරුවන් බිහි කිරීම අරමුණු කර ගත්තකි.
C - ග්‍රාහකයාට ම සම්බන්ධ වූවකි.
D - මාධ්‍ය පරිහරණය කිරීමේ හැකියාවයි.

මේ අදහස්වලින්

1) A හා B සත්‍ය වන අතර C හා D අසත්‍ය වේ
2) A හා D සත්‍ය වන අතර B හා C අසත්‍ය වේ
3) A හා C සත්‍ය වන අතර B හා D අසත්‍ය වේ
4) B හා C සත්‍ය වන අතර A හා D අසත්‍ය වේ
5) B හා D සත්‍ය වන අතර A හා C අසත්‍ය වේ

34. මහජන සම්බන්ධතාවෙහි ගති ලක්ෂණයක් නොවන්නේ,

1) මහජනයා අතර කීර්තිනාමය පවත්වාගෙන යාම ය.
2) සමාජ පිළිගැනීම අරමුණු කරගත් ක්‍රමෝපායික සන්නිවේදනයකි.
3) වාණිජ ඉලක්ක සහ අරමුණු ඉක්මවා යන්නකි.
4) දැන්වීම්කරණ හා අලෙවිකරණ ප්‍රවේශවලින් වෙනස් වූවකි.
5) ක්ෂණික ප්‍රතිලාභ අපේක්ෂිත කෙටිකාලීන ක්‍රියාවලියකි

35. සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1) කථන සන්නිවේදනය තුළ නිර්වාචික ලක්ෂණ ඇතුළත් විය හැකි ය.
2) විවරණය සඳහා භාෂාව පමණක් ප්‍රමාණවත් නොවේ.
3) ජීව භාෂාවන් අඛණ්ඩව භාවිත වීම පොදු ලක්ෂණයකි.
4) භාෂා උපාර්ජනය ළදරු වියට පමණක් සීමා වේ.
5) රූපණය යනු නිශ්චිතව ම පුද්ගලබද්ධ සංසිද්ධියකි.

36. නිර්මාණකරණයට අදාළ කරුණු කිහිපයක් පහත දක්වේ.

A - පුද්ගල අනුභූතීන් බෙදා හදා ගැනීම
B - සාක්ෂරතා ඥානය පැවතීම
C - සන්දේශයෙහි මතුපිට අර්ථය
D - ශිල්පීය විවිධතා ගැන අවබෝධය

මේවා අතුරෙන් නිර්මාණශීලී කියවීම හා සම්බන්ද වන්නේ,

1) A හා B පමණි
2) B හා C පමණි
3) C හා D පමණි
4) A, B හා C පමණි
5) A, B හා D පමණි

37. ප්‍රස්තාව පිරුළු සම්බන්ධයෙන් වඩාත් ගැළපෙන ප්‍රකාශය තෝරන්න.
1) අදහස් කෙටියෙන් හා ප්‍රබල ව ප්‍රකාශ කිරීමේ දී යොදා ගත හැකිය.
2) එදිනෙදා සන්නිවේදන කටයුතුවලට යොදා ගැනීම අපහසු වේ.
3) ගුප්ත හා අදෘශමාන බලවේගවලට සම්බන්ධව නිර්මාණය වූවකි.
4) ජනකථා හා කිසිදු ආකාරයකින් සම්බන්ධතාවක් නොමැත.
5) නව සමාජ සංසිද්ධිවලට අනුව අලුතින් නිර්මාණය නොවේ.

38. මාධ්‍ය විචාරකයාගේ කාර්යභාරය කුමක්ද යන්න සම්බන්ධයෙන් පන්ති කාමරය තුළ සාකච්ඡාවක් මතුවිය.
නිමල් :- විචාරකයාට මාධ්‍යයේ වෘත්තිමය ස්වභාවය පිළිබඳ අවබෝධයක් තියෙන්න ඕන.
කමල් :- සාමාන්‍ය ග්‍රාහකයාට වඩා විමර්ශනාත්මක හැකියා ඉහළ කෙනෙක් වෙන්න ඕනෙ
විමල් :-ඒ වාගෙ ම විචාරකයා මාධ්‍ය නිර්මාණ නිර්දය ලෙස විචාරය කරන්නෙකි
රමල් :- මාධ්‍ය අන්තර්ගතය ගැන අවධානය යොමු කිරීම මිස කර්මාන්තය පවත්වාගෙන යාමට ඔහු දායක නොවිය යුතු ය.

ඉහත අදහස් අතුරෙන් විචාරක භූමිකාව හා ගැළපෙන අදහස් ඉදිරිපත් කරනුයේ
1) නිමල් හා කමල් ය
2) නිමල් හා විමල් ය
3) නිමල්, විමල් හා රමල් ය
3) කමල්, විමල් හා රමල් ය.
5) නිමල්, කමල් හා රමල් ය.

39. මහජන සම්බන්ධතාව යනු කුමක්ද? මැයෙන් පවත්වන දේශනයක් ඇතුළත් වීමට අවම ඉඩක් ඇති ප්‍රකාශය වන්නේ
1) කීර්තිය පිළිබඳ අවධානය යොමු කරන්නකි.
2) මත ගොඩනැගීම හා සම්බන්ධ වූවකි.
3) සැලසුම් සහගතව සිදු කරන කාර්යයකි.
4) හොඳහිත ආරක්ෂා කර ගැනීමට අදාළ වූවකි.
5) නිශ්චිත අවස්ථාවල දී සිදු කරනු ලබන්නකි.

40. සංවර්ධන සන්නිවේදන විධික්‍රම තීරණය කිරීමේදී සලකා බැලීමට යෝජිත අදහස් කිහිපයක් පහත දක්වේ.
A - නවීන තාක්ෂණික සංවර්ධනය සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කළ හැකිය
B - සැලසුම් සම්පාදනය කළ යුත්තේ අදාළ කාර්යය පිළිබඳ විශේෂඥයන් විසිනි.
C - සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රම සමඟ මිශ්‍රව යොදා ගැනීමේ හැකියාව විමසා බැලීම සුදුසුය

D - ඉලක්ක ප්‍රජාව පමණක් අරමුණු කරගත් සැලසුම් සහගත සන්නිවේදනයක් විය යුතුය.

E - භාෂාව ඵලදායී ලෙස භාවිතා කිරීමේ හැකියාව විමසා බලා තෝරා ගත යුතුය.

ඉහත ප්‍රකාශ අතුරෙන් සත්‍ය වන්නේ

1) A, B, D හා E පමණි
2) A, B, C හා D පමණි
3) A, C, D හා E පමණි
4) B, C,D, හා E පමණි
5) A,B,C,D හා E යන සියල්ල ම ය.

41. මහජන චීනයේ නායකයෙකු වූ මාඕසේතුං විසින් සංවර්ධන කාර්යයේදී මහජනයා හා සම්බන්ධ අංග 4 ක් ඉදිරිපත් කරන ලදී. එම අංග 4 වන්නේ

1) ප්‍රජානනය, ප්‍රජා සහභාගීත්වය, නාගරීකරණය, ප්‍රමාතිකරණය
2) සාරාංශකරණය, කාර්මීකරණය, විශ්වසනීයත්වය, ක්‍රියාවට පරිවර්ථනය කිරීම.
3) ප්‍රමාතිකරණය, නාගරීකරණය, කාර්මීකරණය, නවීකරණය
4) ප්‍රජානනය, සාරාංශකරණය, ප්‍රමාතිකරණය, ක්‍රියාවට පරිවර්තනය කිරීම.
5) කාර්මීකරණය, නාගරීකරණය, නවීකරණය, බටහිරකරණය

42. නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1) නැගෙනහිර රටවල ඇදහිලි විශ්වාස බහුලව නැත.
2) ශාන්තිය සඳහා අනවින කොඩිවින. සිදු කරණු ලබයි.
3) නැකත් ශාස්ත්‍රය හා ජ්‍යොතිෂය ජන වෙදකමට සම්බන්ධ වේ.
4) ප්‍රස්ථාවපිරුළු බොහෝ විට ජනකථාවලට සම්බන්ධ නොවේ.
5) මිත්‍යා මූලාශ්‍ර මත පමණක් ජනකථා බිහිවේ.

43. ජනප්‍රිය සංස්කෘතිය තුළ ජනමාධ්‍ය වඩාත් ස්මතුකර දක්වන්නේ

1) වෙළඳ ප්‍රතිලාභ මතුකර ජනාකර්ශනය දිනා ගත හැකි සංදේශයන් ය.
2) බහුතර සංස්කෘතික නියෝජනය සහිත සංදේශයන්ය
3) ග්‍රාහකයාගේ ඥානය ප්‍රවර්ධනය කරන සංදේශයන්ය.
4) ග්‍රාහකයා විසින් ඉල්ලා සිටින අන්තර්ගතයන් සහිත සංදේශයන් ය.
5) ජන සමාජය තුළ ජනප්‍රිය වී ඇති සංස්කෘතිකාංග පාදක සංදේශයන් ය.

44. පහත සඳහන් යුගලවලින් සංකල්පීය ලෙස ප්‍රතිවිරුද්ධ වන්නේ,

1) අධිපතිවාදී සංකල්පය සහ කොමිනිස්ට් වාදී සංකල්පයයි.
2) නිදහස් මතවාදී සංකල්පය සහ බටහිර මතවාදී සංකල්පය යි.
3) අධිපතිවාදී සංකල්පය සහ නිදහස් මතවාදී සංකල්පය යි.
4) කොමිනිස්ට්වාදී සංකල්පය සහ විප්ලව වාදී සංකල්පයයි
5) ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පය සහ සංවර්ධනාත්මක සංකල්පය යි.

45. වාණිජමය ව්‍යාපාරයක මහජන සම්බන්ධතා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේදී **මහජනයා** තීරණය කිරීම අතිශය වැදගත් වේ. එකී කණ්ඩායම්වලට ඇතුළත් විය හැකි අය පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1) සමාජයේ වෙසෙන පොදු මහජනයා මෙමගින් අදහස් කරයි.
2) උපදේශකයින්, සේවා සපයන්නන්, බෙදාහරින්නන් මෙන්ම ආයෝජකයන්ද ඊට ඇතුළත් වේ.
3) ව්‍යාපාරයේ අභ්‍යන්තර ප්‍රජාව හා පාරිභෝගික ප්‍රජාව.
4) පොදු මහජනයා අතුරින් තෝරා ගත් පිරිසක් පමණක් මෙම ගණයට අයත් වේ.
5) එක් ව්‍යාපාරයකට අයත් ඉහත කණ්ඩායම් තවත් ව්‍යාපාරයකදී වෙනස් විය හැක.

46. දැනට ක්‍රියාත්මක තොරතුරු අයිතිය පිළිබඳ නීතිය භාවිත කළ හැක්කේ.

1) ජනමාධ්‍යවේදීනට තොරතුරු ලබා ගැනීම සඳහා පමණි.
2) රාජ්‍ය හා පෞද්ගලික අංශ වල තොරතුරු ලබා ගැනීම සඳහා ය.
3) රාජ්‍ය හා ඊට සම්බන්ධ ආයතන මගින් සිදු කරන කටයුතුවලට අදාල තොරතුරු දැනගැනීමට ය.
4) වසර 10 කට පෙර හුවමාරු වූ රාජ්‍ය ලිපි ලේඛන පරීක්ෂා කිරීමට ය.
5) රාජ්‍ය අංශයට අයත් ඕනෑම තොරතුරක් වහාම ලබා ගැනීම සඳහා ය.

47. රාජ්‍ය මාධ්‍ය සහ පෞද්ගලික මාධ්‍යය මැයි දින රැස්වීම් වාර්තා කර තිබුනේ එකිනෙකට වෙනස් අයුරකිනි. මෙම තත්වය හොඳින් තේරුම් ගැනීමට වඩා වැදගත් වන්නේ

1) මාධ්‍ය හිමිකාරීත්වය පිළිබඳ විචාරාත්මක අවබෝධයයි.
2) මාධ්‍ය වාර්තාකරණය පිළිබඳව යාවත්කාලීන දැනුම
3) මාධ්‍ය දේශපාලනය පිළිබඳව යථාර්ථවාදී දෘෂ්ටියයි
4) මාධ්‍ය සාක්ෂරතාව පිළිබඳව ප්‍රායෝගික කුසලතාවය යි.
5) මාධ්‍ය ස්වාධීනත්වය පිළිබඳව න්‍යායාත්මක පරිචය යි.

48. ලේඛකයා නව කථාවක චරිත අතර සිදුවන සංවේදී පසුබිම් පරිසරය පිළිබඳව ඉදිරිපත් කරන විස්තර කිරීම.

1) වාර්තාකරණයකි
2) රූපණයකි
3) විවරණයකි
4) භාෂණයකි
5) විවේචනයකි.

49. සමකාලීන මාධ්‍ය සංස්කෘතිය තුළ අභිසාරී මාධ්‍ය ප්‍රවණතාව වර්ධනය වන්නේ,

1) ජනමාධ්‍ය නාලිකාවල ප්‍රමාණාත්මක වර්ධනය නිසා
2) ජංගම දුරකථන මගින් ග්‍රාහක ක්‍රියාකාරිත්වය වර්ධනය වන නිසා
3) අන්තර්ජාල ව්‍යාප්තිය නිසා
4) සන්නිවේදනයේ දෘශ්‍ය ප්‍රවණතාවය වර්ධනය වීම නිසා.
5) ගෝලීය කරණයේ දැඩි බලපෑම නිසා

50. විමල් සිය රැකියාවෙන් විශ්‍රාම ගැනීම නිසා සුපුරුදු ජීවන රටාවෙන් බැහැර වීමට ඔහුට සිදුවිය. අනපේක්ෂිත වෙනස්කම් හේතුවෙන් ඔහු මානසික දුර්වල තත්වයටද පත් විය. මෙය,

1) ආතතියේ ලක්ෂණයකි.
2) ක්ලමතයේ ලක්ෂණයකි
3) කාංසාවේ ලක්ෂණයකි
4) විශාදයේ ලක්ෂණයකි.
5) ඇබ්බැහි වීමේ ලක්ෂණයකි

**ද මැසනඩ් විද්‍යාලය**

2019 උසස් පෙළ විභාගයට පෙනී සිටින සිසුන් වෙනුවෙන් පැවැත්වෙන කඩයිම් වාර පරීක්ෂණය

**2019 අගෝස්තු**

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය.**

13 ශ්‍රේණිය

**කාලය පැ. 03**

2019 A/L

■ ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.

## II - කොටස

01. i. ඔබ දන්නා මුද්‍රණ ක්‍රමයන් 2 ක් නම් කර එහි ලක්ෂණ 2 බැගින් ලියන්න.
    ii. ගෝලීය මාධ්‍යයෙහි සංස්කෘතික සංසරණයේ අසමබරතාවය පෙන්නුම් කරන කරුණු 02 ක් කෙටියෙන් විස්තර කරන්න.
    iii. මහජන සම්බන්ධතා වලදී පරිසරය ආශ්‍රිත මෙවලම් භාවිතයේ වාසි 02 ක් විස්තර කරන්න.
    iv. "ප්‍රක්ෂේපනීය වන සන්නිවේදන උපකරණ පංති කාමරය තුළ භාවිතයේ වාසි කරුණු 03 බැගින් ලියන්න.

02. කිසියම් විෂය ක්ෂේත්‍රයක පැවැත්මට, එහි ස්වභාවය හා සීමාවන් හඳුනා ගැනීමටත් විෂය හා බැඳුණු නිර්වචන බොහෝ විද්වතුන් විසින් ප්‍රකාශ කර ඇත. ඒවා අධ්‍යයනයන්ට හඳුකර ගැනීම විද්‍යාර්ථයෙකුට ඉතා වැදගත් වේ.
    i. සන්නිවේදනය පිළිබඳ නිර්වචන 04 ක් සඳහන් කරන්න.
    ii. මහජන සම්බන්ධතා සඳහා ඔබ දන්නා නිර්වචන 02 ක් සඳහන් කරන්න.
    iii. සංස්කෘතිය ගැන ඔබ දන්නා නිර්වචන 03 ක් සඳහන් කරන්න.
    iv. සංවර්ධනය ගැන ඔබ දන්නා නිර්වචන 03 ක් සඳහන් කරන්න.
    (සම්පූර්ණ ලකුණු ලැබීමට නම් නිර්වචන ඉදිරිපත් කිරීමේදී ඇතුලත් විය යුතු කරුණු නිවැරදිව ලිවිය යුතුය)

03. i. අධ්‍යාපනය පාදක කරගත් 'මෙහෙයුම් සංදේශ'' හා ' නඩත්තු සංදේශ වල ස්වභාවය කෙටියෙන් පැහැදිලි කරන්න.
    ii. ''මාධ්‍ය සංස්කෘතිය '' ජන සමාජයට ගෙන දෙන ආවාසි දායක තත්වයන් 02 පැහැදිලි කරන්න.
    iii. මාධ්‍ය සාක්ෂරතාව හා සම්බන්ධ කුසලතා 04 ක් වෙන් වෙන්ව විස්තර කරන්න.

iv. පහත සඳහන් මාතෘකා පහදන්න.

A. නිර්වාචික සන්නිවේදනය

B. මාධ්‍ය නිසා ඇතිවන ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය

04. i. නිර්මාණයක් විචාරය කිරීම සඳහා විචාර ක්‍රම 3 ක් උදාහරණ දෙමින් කෙටියෙන් විස්තර කරන්න.

ii. ජන මාධ්‍ය මගින් පුද්ගලයන්ගේ දෛනික න්‍යාය පත්‍රය ගොඩනැංවෙන ආකාරය කරුණු 03 ක් ඇසුරෙන් විස්තර කරන්න.

iii. විචාරශීලී ග්‍රාහකයාගේ තිබිය යුතු ලක්ෂණ 03 ක් ලියන්න.

iv. රූපවාහිනී මාධ්‍යයේ ලක්ෂණ 4 ක් කෙටියෙන් විස්තර කරන්න.

05. i. භාෂා භාවිත ප්‍රභේද 3 ක් විස්තර කරන්න.

ii. මාධ්‍ය නිවේදනයක් නිකුත් කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 02 ක් කෙටියෙන් විස්තර කරන්න.

iii. නූතන ගුවන් විදුලි FM නාලිකා බහුතරයක් ක්‍රියාකරන ආකාරය ගැන සන්නිවේදන මූලිකාංග 03 ක් විස්තර කරමින් ලියන්න.

iv. මාධ්‍ය දැන්වීම්කරණය මගින් සමාජයට අත්විඳිය හැකි වාසිදායක තත්වයන් 03 ක් විස්තර කරන්න.

06. නිර්මාණාත්මක චින්තනය නිසා අපූර්වත්වයකින් ලෝකය දකිමින් නව සංවර්ධන ව්‍යාපෘති ගොඩනගා ගැනීමට මිනිසාට හැකි වී තිබේ.

i. ජනමාධ්‍ය සන්දේශ විග්‍රහ කිරීමේ දී අවධානය යොමු කරන 'නිර්මාණශීලී කියවීම ' යන්නට අදාල කරුණු 02 ක් සඳහන් කරන්න.

ii. ජන ජීවිතයේදී ජන ගී වැදගත් වන ආකාරය පිළිබඳ කරුණු 04 ක් දක්වා එකක් ගැන කෙටි විස්තර ලියන්න.

iii. නිර්මාණාත්මක සංවර්ධන ව්‍යාපෘතියකදී අවසන් වාර්තාවට ඇතුළත් විය යුතු කරුණු 04 ක් නිදසුන් සහිතව විස්තර කරන්න.

iv. ඉගැන්වීමේ මෙවලමක් ලෙස ජනමාධ්‍ය පහත අවස්ථාවන්හිදී යොදා ගත හැකි ආකාරය පිළිබඳ වචන 200 කට නොඅඩු රචනාවක් ලියන්න.

(අ) භාෂාව ඉගෙනීම (වචන 100)

(ආ) සමාජානුයෝජනය (වචන 100)